# ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

## <u>සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) - ඉංජිනේරු සහකාර (සිවිල්, සැලසුම් ශිල්පි, ප්‍රමාණ හා මිණුම් සමීක්ෂණ) තනතුර සඳහා පුරප්පාඩු පිරවීම. (තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 06කි)</u>

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) - ඉංජිනේරු සහකාර (සිවිල්, සැලසුම් ශිල්පි, ප්‍රමාණ හා මිණුම් සමීක්ෂණ) තනතුරට අදාලව පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**බාහිර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා NVQ පහ (05) වැනි මට්ටමට නොඅඩු ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කර තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

වැටුප් පරිමාණය

**MA 2-2 රු.50,540 - 10 x 540 – 7x 630 – 4 x 1,080 – 20 x 1,280 = 90,270**
**කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II අනුව 2027.01.01 දින දක්වා අදියරගත කාලසීමාව තුළ වැටුප් ගෙවීම් සිදු කරනු ලැබේ.**

- රජය විසින් අනුමත සියළුම දිමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

සෑම අපේක්ෂකයෙක්ම,

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(iii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

<u>තනතුරට අදාළ පොදු කොන්දේසි</u>

1. මෙම තනතුර ස්ථිර වන අතර විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 15% ක්ද සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.

2. රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු වේ.

3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම් සිදුකෙරේ.

4. අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කළයුතුය.

5. අධ්‍යාපන, වෙනත් සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතික වල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුවේ.

6. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

<u>අයදුම් කළ යුතු ආකාරය</u>

මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුලත් ජීව දත්ත සටහන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කොට පහත සඳහන් ලිපිනයට **2026.01.05** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සාමාන්‍යාධිකාරි**
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
1වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ - 02

## ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

**<u>සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ජ්‍යෝෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුර සඳහා පුරප්පාඩු පිරවීම. (තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 01කි)</u>**

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ජ්‍යෝෂ්ඨ ඉංජිනේරු සහකාර තනතුර පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

   **හෝ**

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා **NVQ** හත්වැනි (07) මට්ටමට නොඅඩු සිවිල් ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   **හෝ**

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන අදාළ විෂය ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය කුසලතා NVQ හය 06 වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කර තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනිමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක. මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්ද ලබා තිබීම.

   **හෝ**

4. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන අදාළ විෂය ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය කුසලතා NVQ පහ 05 වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කර තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනිමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක. මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

   **හෝ**

2. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ (**MA 2-2** ) II වන ශ්‍රේණියේ විෂය ක්ෂේත්‍රයට අදාළ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය
**JM 1-1- රු.72,650 - 10 x 1,360 – 18 x 2,040 = 122,970**
**කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II අනුව 2027.01.01 දින දක්වා අදියරගත කාලසීමාව තුළ වැටුප් ගෙවීම් සිදු කරනු ලැබේ.**

- රජය විසින් අනුමත සියළුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

සෑම අපේක්ෂකයෙක්ම,
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(iii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

<u>**තනතුරට අදාළ පොදු කොන්දේසි**</u>

1. මෙම තනතුර ස්ථිර වන අතර විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 15% ක්ද සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.

2. රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු වේ.

3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම් සිදුකෙරේ.

4. අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කළයුතුය.

5. අධ්‍යාපන, වෙනත් සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතික වල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුවේ.

6. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

<u>**අයදුම් කළ යුතු ආකාරය**</u>

මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුලත් ජීව දත්ත සටහන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කොට පහත සඳහන් ලිපිනයට **2026.01.05** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සාමාන්‍යාධිකාරී**
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
1වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ - 02